**පෑලියගොඩ නගර සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**---------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 04 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2015 දෙසැම්බර් 31 දිනට පෑලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දේපල අත්පත් කරගැනීමට අදාලව මාර්ග සංවර්ධන අධිකාරියෙන් 2015 දෙසැම්බර් 31 දින ලද රු.625,000 ක මුදල 2016 වර්ෂයේදී සභා අරමුදලට බැරකර ඇතත්, මෙය සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ලැබිය යුතු ලෙස දක්වා නොතිබුණි.

(ආ) පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොල බලපත්‍ර ආදායම වූ රු.154,000 ක් බිල්කර නොතිබීම හේතුවෙන් ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ගිවිසුම් අත්සන් කරන ලද කර්මාන්ත 16 ක් සඳහා රු.5,410,622 ක් ණයහිමි වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත 02 ක් වෙනුවෙන් පළාත් සභාවෙන් ලැබී තිබූ ප්‍රාග්ධන ආධාර රු.1,163,477 ක් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඊ) ලැබිය යුතු ආදායම් ණයගැතියෝ යටතේ දක්වා තිබූ රු.3,966,656 ක ප්‍රාග්ධන ආධාර නොලැබෙන වත්කමක් වූයෙන් එය ව්‍යාජ වත්කමක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේ ණය පදනම මත ලබාගත් බැකෝ යන්ත්‍රයේ ණය ශේෂය රු.7,704,962 ක්ද, එම යන්ත්‍රයට සභා අරමුදලින් දරන ලද රු.2,270,000 ක මුදල හා පෙර වර්ෂයක ලබාගත් කැබ් රථයට අදාලව ගෙවිය යුතු ණය ශේෂය රු.353,136 ක්ද ඇතුළුව මුළු ශේෂය වූ

රු.10,328,098 ක මුදල මෝටර් රථ ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) පරිත්‍යාග ලෙස ලැබූ මෝටර් රථ හා කරත්ත වටිනාකම වූ රු.26,891,063 ක් ජර්නල් සටහන් 31 මගින් ලැබූ ප්‍රාග්ධන ආධාර ගිණුම බැරකර ප්‍රාග්ධන වියදම් ගිණුම හර කිරීම වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුම් හර කිරීම නිසා ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුම අහෝසිවී තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුමක් ශේෂ පත්‍රයේ නොපෙන්වන අතර, ආදායම් හා වියදම් ගිණුමේ ප්‍රාග්ධන වියදම් ගිණුමද අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 73,130,434 ක්වූ අතර ඒවාට අදාල උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.46,354.622 ක් වූයෙන් රු.26,775,812 ක වෙනසක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂවල එකතුව රු.14,027,671 ක් වූ අතර, ඒ තුළ දිගුකාලයක සිට නිලධාරින් 45 දෙනෙකුගෙන් අයනොවී පවතින රු.777,870 ක ණය ශේෂයක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ රු.5,400 ක ලැබිය යුතු වරිපනම් ගැලපුම් ගිණුම වර්ෂ ගණනාවක සිට පැවත එන නමුත්, එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.5,000 ක වැටුප් අත්තිකාරම් ගිණුම වර්ෂ ගණනාවක සිට පැවත එන අතර, එය නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) එකතුව රු.62,965,648 ක්වූ ගිණුම් විෂයයන් 08 ක් සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගිණුම්වලට අනුව තොග ගබඩා ශේෂය රු. 5,474,575 ක් වුවද එදිනට ගබඩා ලෙජර් ගිණුම්වල ශේෂය දැක්වෙන උපලේඛණයක් ඉදිරිපත් නොවුණි.

1.3.5 **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් විගනණයේදී නිරීක්ෂණය විය.

(අ) නගර සභා ආඥා පනතේ (255 අධිකාරි) 170 (1) , 170(2) වගන්ති ප්‍රකාරව අයවිය යුතු බදු හා දඩ මුදල් ආදිය අයකර නගර සභා අරමුදලට බැර කිරීම සඳහා පියවර ගැනීම ලේකම්ගේ කාර්යය වුවද, රු.31,613,338 ක හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා දේපල තහනම් කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, රු.1,084,955 ක හිඟ ආදායම් අයකර ගැනීමටද පියවර ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව, රු.192,716 ක අගරු චෙක්පත් වල වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 මැයි 19 දිනැති අංක 9/2007(v) චක්‍රලේඛය පරිදි මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට හිමි අනෙකුත් වරප්‍රසාද හිමිවන නමුත්, ඔහුට හිමි 1/20 දීමනාව ගණන් බැලීමේදී ඔහුගේ විශ්‍රාම යන දිනට අදාල වැටුප වූ රු.21,180 මත ගෙවීම් කලයුතු වුවද, එයට පටහැනිව නිවාඩු දින වැටුප් ලෙස රු.16,066 ක් වැඩිපුර ගෙවා තිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.9,946,112 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු10,732,401 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | ඇස්තමේ-න්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
|---|---|---|---|
| | ‘000 රු. | ‘000 රු. | ‘000 රු. |
| වරිපනම් හා බදු | 44,550 | 39,838 | 31,613 |
| බදු කුලී | 2,267 | 2,581 | 658 |
| බලපත්‍ර ගාස්තු | 879 | 1,294 | 427 |
| වෙනත් ආදායම් | 17,655 | 11,577 | 16,640 |
| මුළු එකතුව | 65,351 | 55,290 | 49,338 |

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ආදායම රු.55,290,000 ක් වූ අතර, වර්ෂය අවසානයට හිඟ ආදායම රු.49,338,000 ක් වූයෙන් එය බිල්කල ආදායමින් සියයට 89 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

3.1 **කාර්ය සාධනය**

-------------------

නගර සභාව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් අතරින් 07 ක් ඉටුකර නොතිබූ අතර, 04 ක් අඩක් පමණක්ද 01 ක් සියයට 25 ක් පමණක්ද ඉටුකර තිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

2013 ජනවාරි 31 දින වරිපනම් බදු සඳහා ලද රු.149,210 ක චෙක්පත අගරුවී තිබූ අතර, ඒ සඳහා ලබාදුන් රු.16,579 ක වට්ටම සමාලෝචිත වර්ෂය වනවිටත් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් රු.9,080,000 ක්ද, ඉතිරි මුදල් සභා අරමුදලින්ද වැයකර රු.11,350,000 ක මුදලකට නගර සභාව විසින් බැකෝ යන්ත්‍රයක් මිළදීගෙන තිබුණි. රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන වල නඩත්තු ඒකකය සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර, උපකරණ බෙදාදීම යටතේ 2015 ජුලි 02 දින තවත් බැකෝ ලෝඩර් යන්ත්‍රයක් ලබා දී තිබුණි. 2015 වර්ෂයේදී කසල තුනී කිරීම සඳහා රු.1,048,080 ක මුදලක් පෞද්ගලික අංශයට ගෙවා එම සේවාව ලබාගෙන තිබුණි.

(ආ) සභා කාර්ය මණ්ඩලයට හා නාගරික මන්ත්‍රීවරුන් සඳහා ගලි බවුසරය අවස්ථා 18 කදී නොමිලේ ලබාදී තිබූ අතර, සනාථ කරගැනීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) වාහන අනතුරු දෙකකට අදාලව අළුත්වැඩියාව වෙනුවෙන් රු.562,830 ක මුදලක් වැයකර තිබුණද, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව කලයුතු පරීක්ෂණ සිදුකර නොතිබුණි.

3.4 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ 2008 ජූලි 30 දිනැති අංක 1560/6 ගැසට් නිවේදනයේ පළකර ඇති 2008 අංක 01 දරණ “ඝන අපද්‍රව්‍ය කළමණාකරණ රීති” සියළුම පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කළයුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති අංක.එල්ජීඩී/05/08/පොදු/වෙළුම හා පළාත් පාලන කොමසාරිස් (බස්නාහිර පළාත) ලිපියෙන් දැනුම්දී තිබුණද, රීති මාලාවේ අංක 09, 18(1), 20, 22, 54 හා 59 ප්‍රකාරව සභාව ඒවා ක්‍රියාත්මක කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය